**Trial Monitoring report**

**About the case:** වනාතවිල්ලුව ලැක්ටෝවත්තෙහි පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම හා සම්බන්ධ නඩුව

**Case no. : HC 107/21 (TAB)**

**Courts: High court of Puttalam**

**Date of hearing: 2024.07.17**

**Author (s) of report:** මාධව ඊරියගම

**1. Who was in courts:**

| Who | Names / other information | Comments |
|---|---|---|
| **Judge (s)** | **1.** විනිසුරු නිශාන්ත හපුආරච්චි මහතා<br>**2.** විනිසුරු හසිත සමන් පොන්නම්පෙරුම මහතා<br>**3.** විනිසුරු නයෝමි වික්‍රමසේකර මිය | |
| **Attorney General's Dept.** | ජෙයෂ්ට රජයේ අධිනීතිඥ උදාර කරුණාතිලක<br>සමඟ රජයේ අධිනීතිඥ චාමික ගුරුගේ | |
| **Police (CID / TID etc.)** | **CID Colombo / TID** | |
| **Accused / Suspects** | **1.** අබු හනිෆා මොහොමඩ් මුෆිස් හෙවත් අබු දහිදා<br>**2.** අමීර් හම්සා මොහොමඩ් හමාස් හෙවත් අබු සාෆියා<br>**3.** මොහොමඩ් සරීෆු ආදම් ලෙබ්බේ / ගෆූර් මාමා / ගෆූර් නානා හෙවත් අබු හදීද්<br>**4.** මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා හෙවත් සාදික් හෙවත් සාදික් අබ්දුල්ලා හෙවත් අබු උමර්<br>**5.** මොහොම්මදු ඊබ්‍රහිම් මොහොම්මදු නවුෆර් හෙවත් නවුෆර් මවුලවි හෙවත් අබු සෙයිද්<br>**6.** මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිද් හෙවත් සාජිද් මවුලවි හෙවත් අබු නජා | |
| **Lawyers for accused / suspects** | 1,2,4 චූදිතයින් වෙනුවෙන් නීතිඥ රුෂ්ඩි හබීබ් මහතාගේ උපදෙස් මත නීතිඥ සජාඩ් මහතා<br>3 වන චූදිත වෙනුවෙන් නීතිඥ ඒ.එච්.එම් අල්තාෆ් මහතා<br>5 වන චූදිත වෙනුවෙන් නීතිඥ අද්නාත් ෆසාල් මහතාගේ උපදෙස් මත නීතිඥ සජාඩ් මහතා<br>6 වන චූදිත වෙනුවෙන් නීතිඥ ගසාලි හුසේන් මහතාගේ උපදෙස් මත නීතිඥ සජාඩ් මහතා | |
| **Aggrieved party** | **-** | |
| **Lawyers for aggrieved party** | **-** | |
| **Supporters of accused / suspects** | - | |
| **Supporters of aggrieved party** | **-** | |
| **Others** | **-** | |
| | | |

**2. What happened in court hearing?**

("පැමිණිල්ල" යන්නෙන් පැමිණිල්ල වෙනුවෙන් පෙනීසිටි ජෙයෂ්ට රජයේ අධිනීතිඥ උදාර කරුණාතිලක මහතා ද "විත්තිය" යන්නෙන් 3 වන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි ඒ.එච්.එම් අල්තාෆ් මහතා ද අරුත් ගැන්වෙන බව සළකන්න)

මෙදින සාක්ෂි විමසීම ආරම්භ කරමින් සාක්ෂි අංක 09 උප පොලිස් පරීක්ෂක රුක්ෂාන් වික්‍රමආරච්චි යන සාක්ෂිකරු සාක්ෂියට කැඳවූ අතර ඔහු 2020 අප්‍රේල් මාසයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැදගත් අපරාධයන් පිළිබඳ විමර්ශන සිදු කරන විශේෂ අංශයේ රාජකාරි කළ බවත් ඒ අනුව 2020.04.27 දින සාක්ෂිකරු පොරොත්තු රාජකාරි සිදුකළ බවත් එදින විමර්ශන අංශයේ ස්ථානාධිපතිවරයා විසින් 3 වන චූදිත සහකාර පොලිස් අධිකාරීවරයා වෙත ඉදිරිපත් කරන ලෙස දැනුම් දුන් බවත් පවසා සිටින ලදී. ඒ අනුව උපසේවා රාජකාරී සිදු කළ පො.සැ 42078 ප්‍රියන්ත නිළදාරියා හමුවී සැකකරු පිටතට ගැනීමට යාමේදී ඔහු විසින් සැකකරු සහකාර පොලිස් අධිකාරීවරයා වෙත ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන් අධිකරණ වෛද්‍ය නිළධාරීවරයා වෙත ඉදිරිපත් කරන ලෙස දැනුම් දුන් බවත් පවසා සිටින ලදී. ඒ අනුව සාක්ෂිකරු සහ පො.සැ 8175 පාලිත නිළධාරියා අදාළ 3 වන චූදිත කොළඹ ජාතික රෝහල වෙත ගෙන ගිය බවත් එම ගමනට පො.සැ 53238 මීතැන්න, 93313 රියදුරු කුමාර යන නිළධාරීන්ද සහභාගී වූ බවත් පවසා සිටින ලදී.

මෙහිදි 3 වන චූදිත අධිකරණ වෛද්‍ය රුැල් හක් මහතා වෙත ඉදිරිපත් කළ බවත් එහිදි අධිකරණ වෛද්‍ය පයේෂන පෝරමයේ පොලිස් පිටපත තමන් අධිකරණ වෛද්‍ය නිළධාරී කාර්යාලයෙන් ලබා ගත් බවත් එම පෝරමය පැ 76 වශයෙන් ලකුණු කර ඇති බවත් සාක්ෂිකරු හඳුනාගන්නා ලදී. එසේම අධිකරණ වෛද්‍යවරයා චූදිත පරීක්ෂා කරන අවස්ථාවේ තමා එම ස්ථානයේ නොසිටි බවත් තමා සහ පො.සැ. පාලිත නිළධාරියා අධිකරණ වෛද්‍ය නිළධාරී කාමරයෙන් පිටත රැඳී සිටි බවත් ඉන්පසු කැඳවීමක් ලැබුණු පසු පමණක් තමා එම කාමරයට ගිය බවත් රෝගියා අධිකරන වෛද්‍ය නිළධාරීවරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේ එම කාමරය තුළ කාන්තා සහ පිරිමි තැනැත්තන් දෙදෙනෙක් සිටිනු තමා දුටු බවත් පවසා සිටින ලදී.

ඉන් අනතුරුව සාක්ෂිකරු නැවත 3 වන චූදිත රැගෙන අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව වෙත ගොස් සහකාර පොලිස් අධිකාරි උපුල් සෙනෙවිරත්න යන අය වෙත පැය 15.10 ට සැකකරු ඉදිරිපත් කළ බවත් එම කාමරය තුළ සිදුවූ කිසිවක් තමා නොදුටු බවත් එම කාමරයෙන් පිටතට 3 වන චූදිත ලබා දීමේදී ඔහුගේ ශරීරයේ තුවාල කිසිවක් නොතිබූ බවත් පවසා සිටින ලදී. එමෙන්ම නැවත සැකකරු උපසේවය වෙත භාරදි පැය 15.58 ට සටහනක් දැමූ බවත් සාක්ෂිකරු පවසන ලදී.

හරස් ප්‍රශ්න වලදී විත්තිය විසින් රිළවුස් නැමැති සැකකරුවෙන් 2020.02.27 වැඩිදුර විමර්ශන සඳහා රැගෙන ගියේද යන්න විමසා සිටි අතර එහිදි සාක්ෂිකරු ඔව් ලෙස පිළිතුරු ලබා දෙන ලදී. එසේම අධිකරණ වෛද්‍ය පයේෂණ පෝරමය රෝගියා පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව තමා වෙත ලබා දුන් බවත් තමා පරීක්ෂාවෙන් පසු අධිකරණ වෛද්‍ය නිළධාරී කායාීලයට ඇතුල් වන අවස්ථාවේ වෛද්‍යවරයා එම වාර්තාව පුරවමින් සිටිනු තමා දුටු බවත් අදාළ පෝරමය ලබා දුන්නේ වෛද්‍යවරයා නොව කායාීලය තුළින් බවත් ප්‍රකාශ කල අතර විත්තිය විසින් සාක්ෂිකරු අධිකරණ වෛද්‍ය නිළධාරියාගේ රාජකාරියට අනිසි මැදිහත්වීමක් කළ බව, 3 වන චූදිත

වෛද්‍යවරයා හමුවීමට ගෙනයාම පමණක් සාක්ෂිකරු සිදු කළ බව, සහකාර පොලිස් අධිකාරීවරයා වෙත 3 වන චූදිත රැගෙන ගිය බව සහ චූදිත සාර්ථකව සිංහලෙන් කතා කල බව අසත්‍ය කරුණු වන බව යෝජනා කළ අතර සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කරන ලදී. නැවත ප්‍රශ්න විමසීමේදී 2020.02.27 සාක්ෂිකරු කාර්යභාර නිළධාරියෙක් වශයෙන් සේවය කලේද යන්න පමණක් විමසා සිටි අතර එයට පිලිතුරු ලෙස නැත යන්න සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත.

ඉන් අනතුරුව පො.සැ පාලිත සාක්ෂියට කැඳවූ අතර ඔහු 2020 අප්‍රේල් මාසයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ ඒකකයේ රාජකාරි කළ බවත් වවුනතිව් පොලිස් ස්ථානයේ නිළධාරීන් දෙදෙනෙකු මිය යාමට අදාලව සැකකරුවෙක් ලෙස ආදම් ලෙබ්බේ යන අය රඳවා සිටි බව පැවසීය. සාක්ෂිකරු 2020.04.15 සහකාර පොලිස් අධිකාරි උපුල් සෙනෙවිරත්න යන අයගේ නියෝගයක් මත 3 වන චූදිත ඔහු වෙත පැය 13.50 ට ඉදිරිපත් කර නැවත පැය 14.40 ට උපසේවා නිළධාරි කා.පො.සැ. කුමාරි යන අයට භාර දුන් බවත් 2020.04.17 දින නැවත සහකාර පොලිස් අධිකාරි උපුල් සෙනෙවිරත්න යන අය වෙත චූදිත ඉදිරිපත් කර නැවත උපසේවා නිළධාරිනි උදයංගනි යන අයට භාර දුන් බවත් 2020.04.25 පැය 11.45 ට නැවත චූදිත සහකාර පොලිස් අධිකාරීවරයා වෙත ඉදිරිපත් කළ බවත් පැය 12.25 ට නැවත උපසේවා පො.සැ 35124 ප්‍රනාන්දු යන අයට බාර දුන් බවත් පවසා සිටින ලදී. මීට අමතරව සාක්ෂිකරු 2020.04.27 තුන්වන චූදිත සම්බන්ධයෙන් රාජකාරියක් සිදු කළ බවත් සාක්ෂිකරු උ.පො.ප වික්‍රමආරච්චි සමඟ අධිකරණ වෛද්‍ය නිළධාරීවරයා වෙත 3 වන චූදිත යොමු කළ බවත් පවසා සිටින ලදී. එසේම 2020.04.28 දිනද පො.සැ මාධව නිළධාරියාට 3 වන චූදිත අධිකරණ වෛද්‍ය නිළධාරීවෙත ගෙන යාමට සහය දුන් බවත් එදින අධිකරණ වෛද්‍ය නිළධාරීවරයා එහි නොසිටි බවත් දන්වා සිටින ලදී. විශේෂයෙන්ම චූදිතට සිංහල භාෂාව තරමක් කතා කිරීමේ හැකියාව තිබුනු බව ද සාක්ෂිකරු වැඩිදුරටත් සඳහන් කරන ලදී.

මෙහිදි විත්තිය වෙනුවෙන් හරස් ප්‍රශ්න යොමු කරමින් 3 වන චූදිතගේ සිංහල කථන හැකියාව පිළිබඳ විමසා සිටි අතර ඔහු තරමක හැකියාවක් තිබුනු තැනැත්තෙකු බවත් චතුර ලෙස සිංහල කථා කිරීමේ හැකියාවක් ඔහුට නොමැති වූ බවත් සඳහන් කරන ලද අතර අධිකරණ වෛද්‍ය නිළධාරීවරයාට 3 වන චූදිත පෙන්වන අවස්ථාවේ සාක්ෂිකරු කොහි සිටියේදැයි හරස් ප්‍රශ්නයට භාජනය විය. ඊට පිළිතුරු ලබා දෙමින් ඔහු පවසා සිටියේ අධිකරන වෛද්‍ය නිළධාරී කාර්යාලයේ කොරිඩෝවේ තමා සිටි බවත් අධිකරණ වෛද්‍ය නිළධාරීවරයා උ.පො.ප වික්‍රමාආරච්චි සමඟ දොරෙන් ඇතුල් වූ බවත් ය. ඒ පිළිබඳ දීර්ඝ වශයෙන් ප්‍රශ්න කිරීමේදී අධිකරණයෙන්ද ප්‍රශ්න විමසූ අතර එහිදී 3 වන චූදිත පරීක්ෂා කරන අවස්ථාවේ වෛද්‍යවරයා සමඟ උ.පො.ප වික්‍රමාආරච්චි එම ස්ථානයේ සිටිනු සාක්ෂිකරු විසින් දැක නොමැති බවත් ඔහු දැක ඇත්තේ එම ස්ථානයේ පිහිටි ප්‍රධාන දොරටුවෙන් වෛද්‍යවරයා සමඟ වික්‍රමආරච්චි නිළධාරියා ගමන් කිරීම පමණක් බවත් තහවුරු විය. එසේම විත්තිය විසින් චූදිතට හොඳාකාරව සිංහල කථා කිරීමට නොහැකි බව යෝජනා කල අතර 3 වන චූදිත අධිකරන වෛද්‍ය නිළධාරී හමුවීමට ගෙනයාම පමණක් ඔහු විසින් සිදු කළ බව ද යෝජනා කරන ලදී. එම යෝජනාවන් දෙකම සාක්ෂිකරු විසින් පිළිගන්නා ලදී. විශේෂයෙන් නැවත ප්‍රශ්න විමසීමේදී අධිකරණ වෛද්‍ය කාර්යාලයේ පිටත ඔහු රැඳී සිටි නමුත් ඇතුලත රෝගියා පරීක්ෂා කරන ස්ථානයේ අදාළ වික්‍රමආරච්චි නිළධාරියා සිටියේද යන්න ඔහු නොදුටු බව තහවුරු කරගත් අතර චූදිත සිංහල භාෂාවෙන් සන්නිවේදනය කළ බවද තහවුරු කරගන්නා ලදී.

ඉන් අනතුරුව සාක්ෂියට සාක්ෂි අංක 12 මොහොමඩ් රුල් හක් නම් අධිකරණ වෛද්‍ය නිළධාරීවරයා කැඳවූ අතර ඔහු සාක්ෂි ලබා දෙමින් අධිකරන වෛද්‍ය නිළධාරියෙකු ලෙස තමා 2024.04.27 දින 3 වන චූදිතගේ සෞඛ්‍ය තත්වය පරීක්ෂා කළ බවත් ඔහු පරීක්ෂා කරන අවස්ථාවේ කිසිදු පොලිස් නිලධාරියෙක් එම ස්ථානයේ නොසිටි බවත්. රෝගියා කායිකව සහ සායනිකව ස්ථායි මට්ටමක සිටි තැනැත්තෙක් බවත් ඔහු නාන කාමරයේදී වැටී වම් ඇස ආශිතව තුවාල සිදුවූ බව පවසා සිටි බවත් ප්‍රකාශ කළ බව සඳහන් කරන ලදී. මෙහිදී විශේෂයෙන්ම යම් ආයුධ උපයෝගී කරගෙන පහරදීමක් සිදු කළේ නම් එම ආයුධයේ ස්වභාවය අනුව තැලීම්, ඉරීම් තුවාල වෙනස් විය හැකි බවද ඔහු පවසන ලදී. මෙම රෝගියා නිරීක්ෂණය කරන ලද අවස්ථාවේ තුවාල කැලැල් අවධානයට නොගත් බවත් ඊට හේතුව සෞඛ්‍ය තත්වය පරීක්ෂා කිරීමට පමණක් ඔහු සාක්ෂිකරුවෙත ඉදිරිපත් කිරීම බවත් මූලික ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ඔහු කියා සිටින ලදී.

හරස් ප්‍රශ්න වලදී වෛද්‍යවරයාගේ විශ්වසනීයත්වයට දොස් තැබීමට ඔහුගේ සේවය අත්හිටුවීමක් සිදු කර ඇතිද යන්න හා ඔහු විසින් ලබා දුන් වාර්තා අධිකරණය විසින් පිලිනොගෙන ඇත්ද යන්න විමසා සිටි අතර ඊට පිළිතුරු දෙමින් වැඩතහනමකට ලක්වීම සම්බන්ධයෙන් දැනටම තමා අභියාචනයක් සිදු කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 17/24 යටතේ නඩුවක්ද ගොනු කර ඇති බවත් දන්වා සිටින ලදී.මෙහිදි 3 වන චූදිත පරීක්ෂා කිරීමට පැය භාගයක කාලයක් ගත වූ බව ප්‍රකාශ කල අතර පැරණි තුවාල පිළිබඳ එහිදි අවධානය යොමු කිරීමට ඉඩ තිබූ බවට විත්තිය යෝජනා කරන ලදී. ඊට පිළිතුරු දෙමින් සෞඛ්‍ය තත්වය පමනක් පරීක්ෂා කල බවත් සම්පූර්ණ පරීක්ෂනයක් සිදු කිරීමට පැය 3 කට අධික කාලයක් ගත වන බවත් ඔහු පැවසීය. සාක්ෂිකරු ඇහි බැම්මේ තුවාලයක් ගැනට සටහනක් යොදා ඇතත් එය නාන කාමරයේ වැටී සිදුවූ අනතුරක් වූ බැවින් ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු නොකළ බව පවසා සිටින ලදී. එසේම විත්තිය විසින් සාක්ෂිකරුට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිළධාරීන් අනිසි බලපෑමක් සිදු කළේ යැයි කළ යෝජනාව සාක්ෂිකරු ප්‍රතික්ෂේප කරන ලදී.

මෙම සාක්ෂිකරු විසින් සාදා ඇති ලේඛනයක් විත්තිය විසින් ලකුණු කරන ලද බැවින් සාක්ෂි ආඥා පණතේ නියමිත ප්‍රතිපාදන සඳහන් නොකර සාක්ෂිකරුගේ විශ්වසනීයත්වයට දොස් තැබිය නොහැකි බව පැමිණිල්ල සඳහන් කරන ලද අතර එය ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ල පිළිගන්නා ලදී.

7. **Any significant observations inside court room and outside?**

**4. Next date & time: 2024.09.03**